
# ලස්සන සමනලයා



අනුදි ඉවෙන්යා අලගියවන්න

# ලස්සන සමනලයා

## අනුදි ඉවෙන්යා අලගියවන්න

කතෘ

| | |
|---|---|
| පාසල | : මහාමායා බාලිකා විදුහල, මහනුවර |
| ඉගෙනුම ලබන පන්තිය | : 2 ශ්‍රේණිය D |
| කෘතිය පළ කරන දිනය | : 2026.05.10 |

**ISBN 978-624-211-016-5**

# පිදුම

මා හට මුල් අකුරු කියාදුන්

වාසනා විජේකෝන් ගුරු මැණියන්ට

හා

මාගේ ආදරණීය දෙමාපියන්ට

මෙම පොත පුද කරමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන **"හේමමාලා උපහාර ගත්කරණ"** ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුනතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුලින්, ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය, කන්ද උඩරටට අගයක් එකතු කළ, ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුම උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිරිමාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක ගොඩාක් ලස්සන සමනලයෙක් හිටියා. එයා ලස්සනයි කියලා ආඩම්බර වුණේ නෑ. එයා මල් පැණි බොන්න ගමේ ගෙවල් වලට යනවා.



මේ ගොඩක් ලස්සන සමනලයාට ළමයි ආසා වුණා. "හරිම ලස්සන සමනලයෙක්" කියලා හැමෝම ළමයි කතා වුණා. මේ කතා ඇහුණ සමනලයාට හරිම සතුටුයි. හැබැයි එයා ආඩම්බර වුණේ නම් නෑ.





මේ ලස්සන සමනලයා වෙන ගමකට යයි කියලා, ඒ ගමේ ඉන්න ළමයින්ට ගොඩාක් බය හිතුනා. ඒ නිසා මොකද කරන්නේ කියලා ළමයි කතා වෙන්න පටන් ගත්තා.






යාළුවෝ එක එක කතා කිවුවා. එක යාළුවෙක් කිවුවා "අපි හැම ගෙදරකම ලස්සනට මල් වවමු. එතකොට ලස්සන සමනලයා මල් පැණි බොන්න වෙන ගමකට යන්නේ නැති වෙයි."

හැමෝම ඒකට කැමති වුණා.





දැන් හැමෝම ළමයි ගෙවල්වල ලස්සන පාට පාට මල් ගොඩාක් හදන්න පටන් ගත්තා. මේක දැකපු ලස්සන සමනලයාට ගොඩාක් සතුටුයි. ගමේ හැමෝම එයාට ආදරෙයි කියලා එයාට හිතුණා.



ළමයි හැමදාම එයාලාගේ මල් පැළ වලට වතුර දාලා මල් පිපෙනකම් බලාගෙන හිටියා. දැන් මල් පැළ ටික ටික ලොකු වෙනවා.



ටික දවසකින් ලස්සන පාට පාට මල් ගොඩාක් හැම ගෙදරකම පිපෙන්න පටන් ගත්තා. දැන් ගම හරිම ලස්සනයි. මල් ගොඩාක් තියෙන මල් වත්තක් වගෙයි.



මේ මල් දැකපු ලස්සන සමනලයාට ගොඩාක් සතුටුයි.

එයා මල් පැණි බොන්න හැම ගෙදරකටම ගිහින් ළමයින්ව සතුටු කලා. ළමයි කවුරුත් එයාව අල්ලන්න ගියේ නෑ.

මල් පැණි බොනවා ආසාවෙන් බලාගෙන හිටියා.



මල්වල සුවඳ දැණුන තවත් සමනලයින් ගොඩක් මල් පැණි බොන්න මේ ගමට එන්න පටන් ගත්තා. ලස්සන සමනලයාට යාළුවෝ ගොඩක් ඉන්නවා. දැන් ගම තවත් ලස්සනයි.



ලස්සන සමනලයාට ආදරේ කරපු හොඳ ළමයි ගමේ හිටපු නිසා ගම ගොඩාක් ලස්සන වුණා. දැන් ළමයින්ට වගේම ලස්සන සමනලයාටත් හරිම සතුටුයි. ලස්සන සමනලයා කවදාවත් මල්පැණි බොන්න වෙන ගමකට ගියේ නෑ.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට  අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය භික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත්, යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට, ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියළු දෙනාටද, දියවඩනනිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්යය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN 978-624-211-016-5**